**ජනාධිපතිවරයාගේ අරමුදල - 2017**

**----------------------------------------------**

ජනාධිපතිවරයාගේ අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 9(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදල් පනතේ 10 වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කළ යුතු එකී පනතේ 9(4) වගන්තියෙහි සඳහන් අරමුදලේ ආදායම හා වියදම පිළිබඳ සහ අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය ඇමුණුම 01 ලෙසද ඇතුළත් කර, අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI – 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජනාධිපතිවරයාගේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ජනාධිපතිවරයාගේ අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අරමුදලේ පාලක මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------------

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

-----------------------------------------------

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව දක්වා තිබුණි. ඒ අනුව ප්‍රමිතයේ 2 ඡේදය ප්‍රකාරව උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මුදල් හා උපචිත යන පදනම් දෙකම යොදාගෙන පිළියෙල කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රමිතයේ 53 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ ගිණුම් සටහන්වල සංසන්දනාත්මක තොරතුරු දක්වා නොතිබුණි.

(ඇ) ප්‍රමිතයේ 76 (ඇ) ප්‍රකාරව, වත්කමක් වාර්තාකරණ දිනයෙන් මාස 12 ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන්නේ නම් එම වත්කම ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළයුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට පෙර කල්පිරීමට නියමිත රු. මිලියන 1,543.7 ක ස්ථාවර තැන්පතු ජංගම නොවන වත්කම් ලෙස වර්ගකර දක්වා තිබුණි.

(ඈ) ප්‍රමිතයේ 21 (ඊ) ප්‍රකාරව, අරමුදලේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අදාලව විස්තරාත්මක ගිණුම් සටහන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ ඉන්දියාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ පවත්වාගෙන යන අග්‍රිමය රු.මිලියන 6 ක් හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදී ඇති රු.මිලියන 161 ක ණය ශේෂයට අදාල විස්තරාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව්කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

---

අරමුදලේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ඇතුළත් ආදායම් හඳුනා ගැනීමට අදාළ ප්‍රතිපත්ති හා පදනම මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ දක්වා නොතිබුණි.

**2.2.4 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මහපොළ ශිෂ්‍යත්ව අරමුදල වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබී තිබූ රු.මිලියන 102 ක් ජනාධිපති අරමුදලේ ආදායමක් හා වියදමක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් අරමුදලේ ආදායම් හා වියදම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඇස්බැස්ටෝස් තහඩු වෙනුවට විකල්පයක් හඳුන්වා දීමට පර්යේෂණ සිදු කරනු ලබන පුද්ගලයන්ට ත්‍යාග පිරිනැමීමට අරමුදලක් පිහිටුවීම සඳහා 2015 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.100,000 ක්, ආදායමට ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි.

**2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---

2017 ජුලි 01 සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල විසින් සිදුකළ එක් එක් ගෙවීම් සඳහා අරමුදලේ පාලක මණ්ඩලයේ අනුමැතිය 2018 ඔක්තෝබර් 18 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.76,972,038 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.183,809,157 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.106,837,119 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලැබීම් රු.1,269,395,805 කින් අඩු වී තිබූ නමුත්, මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ දායකය රු.665,229,488 කින් අඩුවීම හා භාණ්ඩාගාර ප්‍රදාන රු.772,877,300 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.


**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ තුන සඳහා අරමුදලේ අතිරික්තය/ ඌනතාවය සහ ශුද්ධ වත්කම් තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | ආදායමේ අතිරික්තය/ (ඌනතාවය) | 2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් තත්ත්වය |
|---|---|---|
| --------------- | -------------------------- | ----------------------------- |
| | රු. මිලියන | රු. මිලියන |
| 2014 | 475 | 2,674 |
| 2015 | 159 | 2,499 |
| 2016 | (184) | 2,296 |
| 2017 | (77) | 2,227 |




ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් කටයුතු වලින් රු.මිලියන 475 ක ශුද්ධ අතිරික්තයක් ලබා තිබූ අතර, 2016 වර්ෂයේ දී එය රු.මිලියන 184 ක ශුද්ධ ඌණතාවයක් දක්වා අඛණ්ඩව පිරිහී තිබුණි. එහෙත්, 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ දී ශුද්ධ ඌනතාවය සියයට 58.15 කින් එනම් රු. මිලියන 107 කින් අඩුවී තිබූ නමුත් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අරමුදලේ ශුද්ධ වත්කම් තත්ත්වය රු.මිලියන 2,674 සිට රු.මිලියන 2,227 ක් දක්වා අඛණ්ඩව ඛාදනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ මුළු ආදායමෙන් සියයට 24.81 ක්වූ රු. මිලියන 501.71 ක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලද රු. මිලියන 1,771.10 ක ආදායම සමග සැසඳීමේදී එය රු. මිලියන 1,269.40 කින් එනම් සියයට 71.67 කින් අඩුවී තිබුණි. 2001 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ගෙවිය යුතු ආදායම් බදු නොගෙවීම මත හිඟව පැවති ආදායම් බදු ශේෂය ගෙවීමට 2017 වර්ෂයේදී රු. මිලියන 1,314 ක මුදලක් වෙන්කිරීම හේතුවෙන්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ජනාධිපති අරමුදල වෙත ප්‍රේෂණය කළ හැකි මුදල් ප්‍රමාණය අඩු වී තිබූ බව විගණනයේදී අනාවරණය විය. කෙසේ වුවද, අරමුදලේ වියදම් පියවා ගැනීම සඳහා රු.මිලියන 772.88 ක් සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර, සංස්කෘතික කටයුතු, ආගමික කටයුතු, සුභසාධන කටයුතු, අධ්‍යාපනික කටයුතු, ක්‍රීඩා හා කලා කටයුතු සහ දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා රු.මිලියන 1,536.69 ක මුදලක් වැය කර තිබුණි. එම මුළු වියදමේ සංයුතිය වෛද්‍යාධාර සඳහා සියයට 88.12 ක්ද, සංස්කෘතික කටයුතු සඳහා සියයට 0.22 ක්ද, ආගමික කටයුතු සඳහා සියයට 0.003 ක්ද, සුභසාධන කටයුතු සඳහා සියයට 0.52 ක්ද, අධ්‍යාපනික කටයුතු සඳහා සියයට 0.007 ක්ද, ක්‍රීඩා හා කලා කටයුතු සඳහා සියයට 0.07 ක්ද, දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව සඳහා සියයට 11.06 ක්ද ලෙස විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයට අදාළව අරමුදලේ එක් එක් වියදම් සම්බන්ධයෙන් විග්‍රහයක් පහත දැක්වේ.

| වියදම් කාණ්ඩය | 2017 වර්ෂය සඳහා වියදම | 2016 වර්ෂය සඳහා වියදම | වියදමෙහි (අඩුවීම)/ වැඩිවීම | 2016 වර්ෂයට සාපේක්ෂව වියදම අඩුවීමේ/ වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වෛද්‍යාධාර | 1,354,130,788 | 1,288,493,432 | 65,637,356 | 5.09 |
| සංස්කෘතික කටයුතු | 3,400,000 | 3,800,000 | (400,000) | 10.53 |
| ආගමික කටයුතු | 50,000 | 5,012,500 | (4,962,500) | 99.00 |
| සුභසාධන කටයුතු | 7,950,000 | 9,632,000 | (1,682,000) | 17.46 |
| අධ්‍යාපනික කටයුතු | 109,000 | 2,350,000 | (2,241,000) | 95.36 |
| ශිෂ්‍යත්ව ප්‍රදානය | 170,046,000 | 125,867,470 | 44,178,530 | 35.10 |
| ක්‍රීඩා හා කලා කටයුතු | 1,000,000 | 2,974,500 | (1,974,500) | 66.38 |

වෛද්‍යාධාර සහ දේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය වෙනුවෙන් දරන ලද වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 5.09 කින් සහ සියයට 35.10 කින් වර්ධනය වී තිබුණු අතර අනෙකුත් වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 10 සිට සියයට 99 දක්වා පරාසයකින් අඩුවී තිබුණි. 2018 අ.පො.ස. උසස් පෙළ ශිෂ්‍යත්ව ලාභීන් සඳහා වාරික දෙකකින් ගෙවනු ලබන ශිෂ්‍යාධාර මුදල් අවශ්‍ය තොරතුරු සනාථ කර ගැනීමෙන් පසු 2017 වර්ෂය තුළදීම ගෙවා නිම කිරීම ශිෂ්‍යත්ව ප්‍රදාන වෙනුවෙන් දරන ලද වියදමේ වර්ධනය කෙරෙහි බලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර ගෙවීම සඳහා රු. මිලියන 1,354.13 ක් වැය කර තිබුණ අතර, ඉන් මහජන නියෝජිතයන් ලෙස තේරීපත්වී සිටින සහ එලෙස සිටි පුද්ගලයන් 09 දෙනෙකු වෙනුවෙන් රු. මිලියන 12.4 ක්ද, අනෙකුත් සියලු පාර්ශවයන් එනම්, සෙසු මහජනතාව වෙත වෛද්‍යාධාර අවශ්‍යතා 8,864 ක් වෙනුවෙන් රු. මිලියන 1,341.73 ක්ද වැයකර තිබුණි. කෙසේ වුවද, සෙසු මහජනතාව වෙත වෛද්‍යාධාර අවශ්‍යතා වෙනුවෙන් වැයකළ ප්‍රමාණය අරමුදලේ මුළු වෛද්‍යාධාර වියදමින් සියයට 99 ක් නියෝජනය විය.

පූර්ව වර්ෂ වලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද සාමාන්‍ය තැනැත්තකු වෙත ගෙවන ලද වෛද්‍යාධාරවල සාමාන්‍ය වටිනාකමට සාපේක්ෂව වඩා වැඩි සාමාන්‍ය වටිනාකමකින් යුතුව මහජන නියෝජිතයෙක් හෝ එලෙස සිටි පුද්ගලයෙකු වෙනුවෙන් වෛද්‍යාධාර ගෙවා තිබූ අතර එය කැපී පෙනෙන මට්ටමක විය.

(ඇ) වෛද්‍යාධාර ගෙවීමේදී රෝගීන් 34 ක් වෙනුවෙන් විවිධ රෝග සඳහා අරමුදලේ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුව වූ අනුමත සීමාව ඉක්මවා රු. මිලියන 28.83 ක් ගෙවීම් කර තිබුණි. එහෙත් ඉහත 3.2 ප්‍රකාරව අරමුදලේ පවතින අයහපත් මූල්‍ය තත්ත්වය පිළිබඳව අවධානය යොමු කිරීමේදී, නියමිත සීමාවන් ඉක්මවා කවර පාර්ශවයකට හෝ වෛද්‍යාධාර ලබාදෙන්නේ නම් එහිදී අදාළ කරගත යුතු සාධාරණීකරණය කල හැකි නිශ්චිත නිර්ණායක හඳුන්වා දීම මගින් අරමුදලේ වියදම් මනාව කළමනාකරණය කරගැනීම උචිත බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී හෘද සැත්කම්, පිළිකා රෝග, වකුගඩු රෝග, මොළය ආශ්‍රිත රෝග සහ වෙනත් ප්‍රතිකාර සඳහා රෝගීන් 8,873 ක් වෙනුවෙන් වෛද්‍යාධාර වශයෙන් රු.මිලියන 1,354.13 ක් වැය කර තිබූ අතර ඉකුත් වර්ෂයේදී රෝගීන් 8,395 ක් සඳහා රු.මිලියන 1,288.50 ක් වැයකර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර ලැබූ රෝගීන් ප්‍රමාණය 478 කින්, හෙවත් සියයට 5.69 කින්ද, වෛද්‍යාධාර වියදම රු.මිලියන 65.63 කින් හෙවත් සියයට 5.09 කින්ද වැඩිවී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| රෝගය | 2017 වර්ෂය | | 2016 වර්ෂය | |
|---|---|---|---|---|
| | පුද්ගලයින් සංඛ්‍යාව | ගෙවන ලද මුදල | පුද්ගලයින් සංඛ්‍යාව | ගෙවන ලද මුදල |
| | | රු. මිලියන | | රු. මිලියන |
| හෘද සැත්කම් | 5,035 | 779.33 | 5,897 | 891.89 |
| පිළිකා රෝග | 497 | 84.48 | 635 | 81.55 |
| වකුගඩු රෝග | 1938 | 255.41 | 724 | 116.59 |
| මොළය ආශ්‍රිත රෝග | 247 | 77.32 | 1,139 | 198.47 |
| වෙනත් | 1,156 | 157.59 | | |
| | 8,873 | 1,354.13 | 8,395 | 1,288.50 |

(ඊ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් රු.මිලියන 1,543.52 ක මුදලක් ආයෝජනය කර තිබූ අතර රු. මිලියන 1,771.92 ක ආයෝජන ආපසු ලබාගෙන තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අරමුදල සතුව පැවති ආයෝජන ශේෂයෙහි රු. මිලියන 228.40 ක පිරිහීමක් පෙන්නුම් කලද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ පොලී ආදායම රු. මිලියන 7.73 කින් වර්ධනය වී තිබුණි. මේ සඳහා වර්ෂය තුල සිදුකරන ලද ආයෝජනයන්හි පොලී ප්‍රතිශතය ඉහළ යාම බලපා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

වෛද්‍යාධාර ගෙවීමේදී රෝගීන්ගේ ආදායම් තත්ත්වය වැනි නිර්ණායක පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු නොකර වෛද්‍යාධාර ලබා දී තිබූ අවස්ථා පැවති බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 4.3 කාර්යමණ්ඩල පරිපාලනය

ජනාධිපතිවරයාගේ අරමුදල සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති අතර, 2017 දෙසැම්බර් 31 දිනට ජනාධිපති ලේකම් කාර්යාලයේ ස්ථිර සේවයේ නියුතුව සිටි නිලධාරීන්ගෙන් අතිරේක ලේකම්වරයෙකු, ජනාධිපති සහකාර ලේකම්වරුන් දෙදෙනෙකු, ගණකාධිකාරීවරයෙකු ඇතුළු නිලධාරීන් 43 දෙනෙක් අරමුදලේ සේවය සඳහා යොදවා තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, සත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී සියයට 15 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**අරමුදලේ ආදායම හා වියදම පිළිබඳ සහ අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශය**

(i) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| **විස්තරය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | |
|---|---|---|
| | **2017** | **2016** |
| | රු. | රු. |
| <u>**ආදායම**</u> | | |
| දායකයන් ලැබීම | 85,175,917 | 63,010,454 |
| පොලී ආදායම | 202,289,639 | 187,773,079 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම * | 501,705,241 | 1,771,101,046 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් ** | 772,877,300 | **-** |
| **මුළු ආදායම** | 1,562,048,097 | 2,021,884,579 |
| <u>**වියදම**</u> | | |
| විගණන ගාස්තු | 170,000 | 170,000 |
| වෛද්‍යාධාර | 1,354,130,788 | 1,288,493,432 |
| සංස්කෘතික කටයුතු | 3,400,000 | 3,800,000 |
| ආගමික කටයුතු | 50,000 | 5,012,500 |
| සුභසාධන කටයුතු | 7,950,000 | 9,632,000 |
| අධ්‍යාපන කටයුතු | 109,000 | 2,350,000 |
| ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | 170,046,000 | 125,867,470 |
| ක්‍රීඩා හා කලා කටයුතු | 1,000,000 | 2,974,500 |
| මහපොල උසස් අධ්‍යාපන භාරකාර අරමුදලට 50% ක දායකත්වය | 102,164,346 | 767,393,833 |
| මුළු වියදම | 1,639,020,134 | 2,205,693,735 |
| ආදායම් ඌනතාවය | **76,972,037** | **183,809,156** |

* ඉකුත් වර්ෂවලට අදාල ආදායම් බදු සමාලෝචිත වර්ෂයේදී ගෙවීමට සිදුවීම සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබෙන ආදායම අඩුවීමට හේතු වී තිබුණි.

** වර්ෂය තුල වියදම් දැරීමට ප්‍රමාණවත් ආදායම් නොලැබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත සමාලෝචිත වර්ෂය තුල මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් මුදල.

(ii) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආයෝජන වර්ගය | 2017 ජනවාරි 01 දිනට ශේෂය | 2017 වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | ආයෝජනය කිරීම් | ආයෝජන නිදහස් කිරීම් | |
| | රු. | රු. | රු. | රු. |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව - ස්ථාවර තැන්පත් | **1,470,294,000** | **-** | **1,470,074,000** | **220,000** |
| මහජන බැංකුව - ස්ථාවර තැන්පත් | **120,792,341** | **1,543,520,345** | **120,792,341** | **1,543,520,345** |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජන | **2,200,000** | **-** | **-** | **2,200,000** |
| භාණ්ඩාගාර බැඳුම්කර | **338,790,000** | **-** | **-** | **338,790,000** |
| ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් | **181,050,000** | **-** | **181,050,000** | **-** |
| | **2,113,126,341** | **1,543,520,345** | **1,771,916,341** | **1,884,730,345** |